5 වන පිටෙන්

සමඟ සබඳතා පවත්වමින් කොටින්ට විරුද්ධව රහසිගතව ක්‍රියා කරන බවට එම චෝදනා වලින් කියැවිණ. අවසානයේ බාලසිංහම්ගේ පදයට නටමින් "මහින්ද චින්තන" රජයේ ආරක්ෂක ප්‍රධානීහු මේජර්වරයාව ඔත්තු අංශයෙන් ඉවත් කර වෙනත් ස්ථානයකට අනුබද්ධ කළහ.

යුද හමුදාපති ලුතිනන් ජෙනරාල් සරත් ෆොන්සේකා මහතාව 2006 අප්‍රේල් මාසයට පෙර ඝාතනය කිරීමට කොටි සැලසුම් කරන බවට 2004 වර්ෂයේ සිට මේජර් සමන් වෙදගම මහතා (ආර්.එස්.පී. - නි/60862) රහසිගත වාර්තා මගින් ලිඛිතව යුද හමුදා රහස් තොරතුරු අංශයේ අධ්‍යක්ෂ ජෙනරාල්, මේජර් කපිල හෙන්ද විතාරණ මහතාට කීප අවස්ථාවකම දැනුම් දී තිබිණ. නමුත් අදාළ වගකිවයුතු බලධාරීන් ඒ ගැන නිසි අවධානය යොමු කළේ නැත. පසුව මේජර්වරයා 2006 ජනවාරි මස 04 වැනිදා හමුදාපති වරයාව පුද්ගලිකව හමු වී එම වාර්තාව භාර දුන්නේය. එහෙත් බලධාරීන් හමුදාපතිවරයාව ආරක්ෂා කිරීමට හා මේජර් වරයාගේ තොරතුරු ගැන නිසි අවධානය යොමු කිරීමට එතරම් උත්සාහ නොකිරීම ඔහුව හමුදා මූලස්ථානය තුළදීම පසුගිය අප්‍රේල් මස 24 වැනිදා බෝම්බ ප්‍රහාරයට ලක්වීමට හේතු විය. මේජර් වෙදගම මහතා කොටින්ගේ තර්ජනයට ලක්වී ඇති නිලධාරියෙකි. ඔහුව කිසියම් අවස්ථාවක කොටි බිලි ගැනීමට බැරි නැත. එවැනි තත්ත්වයක් තුළ ඔවුන්ගේ ආරක්ෂාව තර කළ යුතුය. නමුත් යුද හමුදා රහස් තොරතුරු අංශයේ අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් දම්මික ලියනගේ මහතා මෙහිදී අනුගමනය කරන්නේ ඊට සපුරා ප්‍රතිවිරුද්ධ ප්‍රතිපත්තියකි.
මේජර්වරයාට පල නොකියා පලා බෙදීමට ඔත්තු අංශ ප්‍රධානීන් ක්‍රියාකර ඇත.

මීට පෙර ඔහුගේ ආරක්ෂක රථය හමුදා බලධාරීන් විසින් ආපසු පවරාගෙන තිබිණි. දැන් ඔහුගේ ආරක්ෂාවට යොදවා සිටින හමුදා සෙබළුන් තිදෙනාව හා අවි ආයුධ වහාම භාරදෙන ලෙස බ්‍රිගේඩියර් දම්මික ලියනගේ හෙවත් ඒ.ජේ.පී.එස.ටී. ලියනගේ (ආර්.එස්.පී.යූ.එස්.බී) මහතා මේජර් වරයාට 2006 ජූනි මස 07 වනදා ලිඛිතව දැනුම් දී ඇත. මෙම නියෝගය වහාම ක්‍රියාත්මක කළයුතු බවත් එසේ නොවුණහොත් ඔහුව විරුද්ධව විනයානුකූලව ක්‍රියා කරන බවත් දක්වමින් බ්‍රිගේඩියර් ලියනගේ මහතා අනතුරු ඇඟවීමේ ලිපියක් මේජර්වරයාට යවා ඇති බව අඹේපුස්ස සිංහ රෙජිමේන්තු මූලස්ථානයේ ප්‍රධානියෙක් මෙම ලියුම්කරු සමඟ දුරකථනයෙන් සාකච්ඡා කරමින් සිටියදී ප්‍රකාශ කළේය.

මේ අනුව මේජර් වෙදගම මහතාගේ ආරක්ෂාවට ලබාදී ඇති ටී 56 වර්ගයේ ස්වයංක්‍රීය මැෂින තුවක්කුවක් (අංකය 5090083) මැගසින් 4 ක්, මොඩල් 213 මි.මී. 9 පිස්තෝල මැගසින් 2 ක්, මි.මි. 9 ජීව පතුරම් 13 ක්, මි.මි. 9 බ්‍රව්නින් පිස්තෝලයක් (අංකය ඊ 36176) මැගසින් එකක් හා 7.62 ජීව පතුරම් 120 ක් මෙලෙස ආපසු භාරදෙන ලෙස බ්‍රිගේඩියර් වරයා "පිස්තෝල භාරදීම හා ආරක්ෂාවට යා කර ඇති සෙනෙවියන් ආපසු රපෝර්තු කිරීම" යනුවෙන් නියෝග කර ඇති බවද නිලධාරියා කීය.

මෙම ආයුධ හා ආරක්ෂක භටයන් තිදෙනා ආපසු භාරගතහොත් තමාගේ ජීවිතයට කොටින්ගෙන් දරුණු තර්ජනයක් එල්ල වන බැවින් ආරක්ෂක භටයන් හා ආයුධ ආපසු භාර ගැනීමෙන් වළකින ලෙස මේජර් සමන් වෙදගම මහතා අඹේපුස්ස යුද හමුදා සිංහ රෙජිමේන්තු බලකායේ අණදෙන නිලධාරී බ්‍රිගේඩියර් ජයනාත් පෙරේරා මහතාට ලිඛිතව දැනුම් දී ඇත.

වසර 21 ක් පමණ යුද හමුදාවේ සේවය කර ඉන් වසර 17 ක්ම හමුදා ඔත්තු අංශයේ සේවය කරමින් රටේ ජාතික ආරක්ෂාව සුරක්ෂිත කිරීම උදෙසා මහඟු සේවයක් කරමින් අදවන විට කොටින්ගේ දරුණු තර්ජනයට ලක් වී ඇති නිලධාරියකුගේ ආරක්ෂාව හිටි අඩියේම ඉවත් කිරීම කිසිවෙකුටවත් අනුමත කළ හැකි දෙයක් නොවෙයි.
මේජර්වරයාට කොටින් ගෙන් එල්ල වී ඇති ජීවිත තර්ජන පිළිබඳ සොයා බැලීමට කොළඹ ප්‍රදේශ භාර නියෝජ්‍ය පොලිස්පති පූජිත ජයසුන්දර මහතා මේ වනවිට පරීක්ෂණයක් ආරම්භ කර ඇත.
එහි ප්‍රතිඵලයක් වශයෙන් පසුගිය ජූලි මස 22 වෙනිදා බොරැල්ල පොලිසියේ පොලිස් පරීක්ෂක වරයෙක් මේජර්වරයා පදිංචි නිල නිවසට ගොස් සොයා බැලීමක් කර ඇත. මෙහි දරුණු තත්ත්වයක් නම් මේජර්වරයාට සිය නිල නිවස පවා ආපසු භාරදෙන ලෙස හමුදා ඔත්තු අංශයේ බලධාරීන් නියෝග කර ඇත. දරු දෙදෙනෙකුගේ පියෙක් වන ඔහු මේ නිසා දැඩි අපහසුතාවකට පත්ව ඇත. රට වෙනුවෙන් සේවය කරන හමුදා නිලධාරීන්ට අවසානයේදී අත්වන ඉරණම මෙයද යන ප්‍රශ්නය මතු වේ. රටේ අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කළ හමුදා නිලධාරීන්ට එලෙස කෙනෙහිලිකම් කරන විට රට වැනසීම උදෙසා ත්‍රස්තවාදී ක්‍රියා කරන කොටි මාධ්‍ය ප්‍රකාශක දයා මාස්ටර්ට ඉහළ ආරක්ෂාව සපයා කොළඹ ඇපලෝ රෝහලෙන් ප්‍රතිකාර ලැබීමට පහසුකම් සැපයීමට රජයේ පසුගිය ජූලි මස 12 වැනදා පියවර ගත්තේය. ත්‍රස්තවාදී නායකයෙකු වූවත් හදිසි අනතුරකදී පිහිටවීමේ අරමුණින් මානුෂික ආධාර පතා දයා මාස්ටර්ට ප්‍රතිකාර ගැනීමට පහසුකම් සැපයූ බව ජනාධිපති මහින්ද රාජපක්ෂ වෙනුවෙන් රජය ප්‍රකාශ කළේය.

*මෙම ආයුධ හා ආරක්ෂක භටයන් තිදෙනා ආපසු භාරගතහොත් තමාගේ ජීවිතයට කොටින්ගෙන් දරුණු තර්ජනයක් එල්ල වන බැවින් ආරක්ෂක භටයන් හා ආයුධ ආපසු භාර ගැනීමෙන් වළකින ලෙස මේජර් සමන් වෙදගම මහතා අඹේපුස්ස යුද හමුදා සිංහ රෙජිමේන්තු බලකායේ අණදෙන නිලධාරී බ්‍රිගේඩියර් ජයනාත් පෙරේරා මහතාට ලිඛිතව දැනුම් දී ඇත.*

ඔහු එසේ ප්‍රකාශ කළත් ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය හා රජයේ ආරක්ෂක කටයුතු පිළිබඳ මාධ්‍ය ප්‍රකාශක කෙහෙළිය රඹුක්වැල්ල මහතා පසුගිය ජූලි මස 26 වැනිදා පැවති ප්‍රවෘත්ති සාකච්ඡාවකදී ප්‍රකාශ කළේ ඊට හාත්පසින්ම වෙනස් වූ කතාවකි. "දයා මාස්ටර් ප්‍රතිකාර ගැනීමට හොර රහසේ වෙනත් රටකට යෑමට උත්සාහ කළා. අපි එය වැළැක්වීමටයි ඔහුට වෛද්‍ය ප්‍රතිකාර ගැනීමට පහසුකම් සැලසුවේ" යනුවෙන් රඹුක්වැල්ල ඇමැතිවරයා කීය. ඔහුගේ හා ජනාධිපතිවරයාගේ අදහස් පරස්පර විරෝධීය. දයා මාස්ටර්ගේ සිද්ධිය ඉස්මතු වනවිට ඇඟ බේරා ගැනීම උදෙසා රජයේ බලධාරීන් ඒ ඒ අවස්ථාවට විවිධ පිළිතුරු දෙන බව මින් පැහැදිලි වේ. ඊටත් රඹුක්වැල්ල ඇමැතිවරයා ප්‍රකාශ කරන ආකාරයට දයා මාස්ටර් ට ප්‍රතිකාර ගැනීමට පහසුකම් සැපයූවේ ඔහු රටෙන් යාම සූදානමක් තිබූ නිසාලු. එහි සත්‍ය අසත්‍යතාව පිළිබඳ අපි කිසිවෙක් නිශ්චිතව දන්නේ නැත. කෙසේ වෙතත් ඔහු රටින් පැනීමේ සූදානමක් තිබුණේ නම් එය වැළැක්වීම උදෙසා දයා මාස්ටර්ට ප්‍රතිකාර පහසුකම් සැපයීමේ රජයට අත්වන වාසිය කුමක්ද? කිසිවක් නැත. සිදුවී ඇත්තේ එම සිදුවීම හරහා රජයට තවත් ජනතා විරෝධය එල්ලවීම පමණි. කිලිනොච්චියේ සිට දයා මාස්ටර් කොළඹ පැමිණියේ පොළොන්නරුව, පළුගස්දමන, සේවාගම අංක 154 නිවසේ පදිංචි රත්නායක මුදියන්සේලාගේ ආනන්ද සරත් කුමාර රත්නායක මහතාට අයත් H.K. 6922 අංක දරණ මිට්සුබිෂි මෝටර් රථයෙනි. එහි එංජින් අංකය 4එ 40 DQ 0665 වන අතර චැසි අංකය JMYLNV 76W2J000331 ලෙස සඳහන් වේ.

2003 සැප්තැම්බර් 18 වනදා ලියාපදිංචි කර ඇති මෙම මෝටර් රථයේ අයිතිකරු වන රත්නායක මහතා උතුරුමැද පළාත් සභාවේ කෘෂිකර්ම ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යවරයාය. ඔහුට රජයෙන් ලැබුණු වාහන බලපත්‍රය මෙලෙස කොටින්ට විකුණා ඇත. නමුත් ඔහු එය ප්‍රතික්ෂේප කරයි. ඔහු ප්‍රකාශ කරන්නේ තමන්ගේ ළඟම හිතවතෙකුට එම මෝටර් රථය විකිණූ බවය. නමුත් නීතියට අනුව රජයෙන් ලැබෙන වාහන බලපත්‍රය වසර 5 ක් යනතුරු කිසිවෙකුටත් විකිණීමට බැරිය. එය නොතකා විකිණීමෙන් ඔහු බරපතළ වරදක් කර ඇත. එහෙත් රජයෙන් ඊට විරුද්ධව කිසිදු ප්‍රතිචාරයක් නැත.

**සන්නස අන්තර්ජාලයෙන් කියවන්න**
www.sannasa.net

TAX REFUNDS
within 14 DAYS

GET YOUR TAX RETURNS DONE TODAY

INDIVIDUAL RETURNS $65
BAS/IAS and BUSINESS RETURNS

Mala
9470 8241 (after hours)
or 0401 000 421
to make an appointment

Jagath - Sannasa

## My Father is Angry

By : Susil Ratnasekara

***He can still see***
***Destruction, Corruption***
***Misery and Death***
***Nothing has changed***
***Over the Years***
***Since Independence***
***Proclaimed***
***Getting Worse***
***Day by Day***

***Sudden Bomb Blasts***
***And Killings***
***Fear fills people's bodies***
***And their souls***
***Suffering, Insecurity***
***And Hunger***
***Without Shelter***
***Awaiting for***
***A peaceful solution***

***My Father is angry***
***People Screaming***
***Running***
***Crying***
***No living***
***Hands cover***
***Their faces***
***Try to hide***
***Their pain***

***My Father is angry***
***With hunched shoulders***
***And a wrinkled face***
***Coming back from the field***
***With muddy feet***
***Feeling the loss***
***And Sorrow***
***In Distress***
***Over the Years***

***My Father whispers***
***Their Names***
***Since independence***
***Different faces***
***Different Colors***
***But the same Demon***
***Nothing being done***
***For the people***
***But themselves***

***My Father is angry***
***With a long face***
***Another demonic***
***From the North***
***Destroy Sovereignty***
***Yours and Mine***
***And Of course***
***Cherished Motherland***
***Yours and mine***

***My Father is angry***
***International community***
***World Bank***
***Work on profit***
***He said f word***
***Another Devil***
***An International Devil***
***Forgotten***
***Human welfare***

***My Father is angry***
***And Screaming***
***Is there anyone***
***Anyone at all***
***With a backbone***
***A leader***
***The Real Leader***
***For You and Me***
***For Now and For Ever***